# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1379 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 26/08/2024<br>පැය 0740 |

## මාධ්‍ය නිවේදනය

### 01. අයිස් මත්ද්‍රව්‍ය සහ හෙරොයින් සමග සැකකාරියන් දෙදෙනෙකු හා සැකකරුවන් සිව්දෙනෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.08.25 වන දින කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත ග්‍රෑන්ඩ්පාස් සහ මට්ටක්කුලිය පොලිස් වසම් දෙකෙහි වැටලීම් 03 ක් සිදුකර,

01. ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ මාදම්පිටිය පාර ප්‍රදේශයේදී **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 08 මිලිග්‍රෑම් 460 ක් සන්තකයේ තබාගෙන ඇසුරුම් කරමින් සිටි සැකකාරියක් සහ සැකකරුවන් තිදෙනෙකු,**

02. ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ මාදම්පිටිය පාර ප්‍රදේශයේදී **හෙරොයින් ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 470 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්**

03. මට්ටක්කුලිය පොලිස් වසමේ කදිරානවත්ත ප්‍රදේශයේදී **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 630 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 28, 42, 51 හා 52 වයස්වල පසුවන කොළඹ 14 හා මට්ටක්කුලිය ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර, සැකකාරියන් අවුරුදු 32 හා 54 වයස්වල පසුවන කොළඹ 14 හා කොළඹ 15 ප්‍රදේශවල පදිංචිකාරියන් වේ.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකාරියක් හා හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය.

2024.08.25 වන දින සවස් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ තොටලග ප්‍රදේශයේදී බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීම් දෙකක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 400 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් සහ ජා ඇල පොලිස් වසමේ ස්වර්ණහංස පාර ප්‍රදේශයේදී හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 400 ක් සන්තකයේ තබාගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන ජා ඇල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර, සැකකාරිය වයස අවුරුදු 54 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**